ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අරමුදල් කළමනාකරණ සමාගම - 2020
--------------------------------------------------------------------------------

**1.1** මතය

-----

ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අරමුදල් කළමනාකරණ සමාගමෙහි 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී.පාර්ලිමේන්තුවේ සභා ගත කළ යුතු යැයි මා අදහස් කරන මගේ අදහස් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

සමාගමේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2** මතය සඳහා පදනම

--------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

--------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත්කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගම වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

**1.4** මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

--------------------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදු කරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් හඳුනා නොගැනීම මගින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ නිගමනයන් විගණන වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනු දෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශන වල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල සමාගමේ කාර්යන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබුවේද යන බව;

- යම් අදාල ලිඛිත නීතියනට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියා කර ඇති බව;

- සමාගමේ සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව ව කටයුතු කර ඇති බව;

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාල සීමාවන් තුල සහ අදාල නීති රීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව;

**1.5** ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

**1.5.1** ලැබිය යුතු ගිණුම්

| විගණන ගැටළුව | කළමණාකරණ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2016 වර්ෂයේදී අමාත්‍ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකන් ගුවන් සේවය ප්‍රතිනිර්මාණය කිරීමේ ව්‍යාපෘතිය සඳහා ප්‍රධාන කළමනාකරු ලෙස සමාගම පත් කර තිබුණි. මේ සම්බන්ධයෙන්, භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු ශේෂය රු.246,939,587 ක් වූ අතර, එම ශේෂයෙන් 2020 වසර අවසානයට රු. 88,939,587 ක ශේෂයක් තවදුරටත් හිඟව පැවතුණි. | සටහන් කර ගන්නා ලදි.<br><br>මේ වන විට සමාගම ඉල්ලීම් ගණනාවක් කරතිබේ.ආසන්නතම ඉල්ලීම 2021.07.20 දින සිදු කරන ලදී. | සමාගම භාණ්ඩාගාරයෙන් ලැබිය යුතු මුදල අයකරගත යුතුය. |

**2.** මූල්‍ය සමාලෝචනය

**2.1** මූල්‍ය ප්‍රතිඵලය

සමාගමේ ශුද්ධ ලාභය 2019 දී රුපියල් මිලියන 515 සිට 2020 දී රුපියල් මිලියන 608 දක්වා වැඩි වී ඇත. එම නිසා, මූල්‍ය ප්‍රතිඵලයෙහි රුපියල් මිලියන 93 ක හෙවත් සියයට 18 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ප්‍රධානතම හේතුව, පෙර වසරට සාපේක්ෂව රජයේ සුරැකුම්පත්වල ශුද්ධ පොලී ආදායම මිලියන 150.2 කින් හෙවත් සියයට 35 කින් ඉහළ යාමයි.

**2.2** ප්‍රධාන ආදායම් හා වියදම් අයිතමයන්ගේ උපනති විශ්ලේෂණය

මේ යටතේ සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් සහ වියදම් අයිතමවල උපනති විශ්ලේෂණය පෙර වසර හා සසඳන විට වැඩිවීමේ හෝ අඩුවීමේ ප්‍රතිශතය සමඟ ඇඟයීමට ලක් කර, නිරීක්ෂණ පෙන්වා ඇත.

| විස්තරය | විචලනය හිතකර/ (අහිතකර) (රු.) | විචලනය (%) | විචලනය සඳහා හේතු |
|---|---|---|---|
| පොලී ආදායම | 51,867,492 | 4 | රජයේ සුරැකුම්පත් මත ආයෝජනය වැඩි වීම. |
| පොලී වියදම | (98,319,993) | (10) | නැවත මිලදී ගැනීමේ ගිවිසුම් ගාස්තු අඩු වීම. |
| ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම | (7,218,871) | (13) | වසර තුළ භාරකාර ගිවිසුම් හයක් සම්පූර්ණ වීම හේතුවෙන් ශුද්ධ ගාස්තු සහ කොමිස් ආදායම අඩු වී ඇත. |
| ක්ෂයවීම් සහ ක්‍රමක්ෂය | (3,428,850) | (190) | 2019 දී රුපියල් 605,579 ක් වූ කල්බදු ගොඩනැගිලි සඳහා ක්ෂය වීම 2020 දී රුපියල් 3,633,473 ක් විය.(2019 දෙසැම්බර් මාසයේදී නව කල්බදු ගොඩනැගිල්ලකට ගෙන යන ලදි) |

2.3 අනුපාත විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ වැදගත් ගිණුම්කරණ අනුපාතයන් ආංශික අනුපාත සමඟ සසඳා පහත දැක්වේ.

| විස්තරය | ආංශික | | සමාගම | |
|---|---|---|---|---|
| | 2020 | 2019 | 2020 | 2019 |
| ස්කන්ධය මත ප්‍රතිලාභ අනුපාතය (ROE) (%) | 30.5 | 28.5 | 16.96 | 17.01 |
| වත්කම් මත ප්‍රතිලාභ අනුපාතය (ROA)(%) | 7.6 | 6 | 5.48 | 4.78 |
| බර තැබූ අවදානම් ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාතය (RWCAR) (%) (Minimum 10%) | 27 | 27.6 | 35.01 | 27.88 |

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 මානව සම්පත් කළමනාකරණය

| | විගණන ගැටළු | කළමණාකරණ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 1. | සමාගමට සේවකයින් බඳවා ගැනීමේ ක්‍රමවේදයක් නොමැති අතර,2003 ජුනි 02 දිනැති PED / 12 රාජ්‍ය ව්‍යවවසාය චක්‍රලේඛයේ 9 වන පරිච්ඡේදයේ 9.2 සහ 9.3 ඡේදවලට අනුව අනුමත සේවක සංඛ්‍යාව ද තීරණය කර නොතිබුණි. | ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අරමුදල් කළමනාකරණ සමාගම විසින් සමාගමේ ආයතනික ව්‍යුහය, අනුමත සේවක සංඛ්‍යාව මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර ඇත. ප්‍රාථමික අලෙවි නියෝජිත සමාගමක් ලෙස, ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අරමුදල් කළමනාකරණ සමාගම සතුව මානව සම්පත් ප්‍රතිපත්තියක් (අනුප්‍රාප්තික සැලැස්ම ඇතුළුව) ඇති අතර, සියලුම බඳවා ගැනීම්, උසස්වීම් සහ වේතන, ප්‍රතිපත්තියට අනුකූලව මානව සම්පත් සහ වේතන කමිටුව (BHRRC) සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව සිදු කෙරේ. | සමාගම, රජයට අයත් සමාගමක් ලෙස PED චක්‍රලේඛ වලට අනුකූල විය යුතුය. |
| 2. | 2020 දෙසැම්බර් 31 දිනට සමාගමේ අනුමත සේවක සංඛ්‍යාව සහ සත්‍ය සේවක සංඛ්‍යාව පිළිවෙළින් 24 සහ 20 විය. මෙම පුරප්පාඩු හතර ආයෝජන සහකාර මට්ටමේ 3කින් සහ කළමනාකරණ මට්ටමේ පුරප්පාඩු එකකින් සමන්විත වේ. ආයෝජන සහකාර සහ කළමණාකරු යන ප්‍රධාන තනතුරුවල පුරප්පාඩු, සමාගමේ ප්‍රධාන අරමුණු ඉටුකර ගැනීමට සෘජුවම බලපානු ඇත. | සමාගම දැනටමත් ආයෝජන සහකාරවරුන් 02ක් සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරුවෙකු බඳවාගෙන ඇත. අනෙකුත් බඳවා ගැනීම්,සිදුකෙරෙමින් පවතී. | සමාගමේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ප්‍රශස්ත කාර්ය මණ්ඩලයක් පවත්වා ගත යුතුය. |

## 4. වගවීම සහ යහ පාලනය

### 4.1 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන ගැටළු | කළමණාකරණ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1. 2020-2022 ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් පරිදි, 2020 වර්ෂයේදී නව ගණුදෙනුකරුවන් සංඛ්‍යාව 70 කින් වැඩි කරගැනීමට සමාගම සැලසුම් කර තිබුණි.කෙසේ වෙතත්, වසර අවසානයේදී ගණුදෙනුකරුවන් සංඛ්‍යාව 29 කින් පමණක් වැඩි වී තිබුණි. ගණුදෙනුකරුවන් වැඩි කරගැනීමේ පදනම මත සැලසුම් කළ ක්‍රියාකාරකම් සමාගම විසින් සාක්ෂාත් කර ගෙන නොතිබුණි. | රටතුළ පවතින කොවිඩ්-19 වසංගතය හේතුවෙන් සේවක සේවිකාවන් සේවාමුර ක්‍රමයට වැඩ කරන අතර දෛනික ක්‍රියාකාරකම් සඳහා ප්‍රමුඛත්වය ලබාදී ඇත. තවද, රට අගුළු දැමීම හේතුවෙන් අනෙකුත් ක්‍රියාකාරකම් සඳහා තෙවන පාර්ශවයන් සම්බන්ධීකරණය කිරීම සිදුකර ගත නොහැකිව තිබුණි. එබැවින්, සියළු දෙනාට බලපෑම් එල්ල වූ බැවින් සැලසුම් කළ පරිදි කාර්යයන් සම්පූර්ණ කරගැනීමට ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අරමුදල් කළමනාකරණ සමාගමට නොහැකි විය. එම දුෂ්කරතා සමඟ, සමාගම 2020 දී ගනුදෙනුකරුවන් 29 දෙනෙකු ආකර්ෂණය කර ගන්නා ලදි. | සමාගමේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සමාගම වාර්ෂික සැලසුම් ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කළ යුතුය. |
| අ) 2019 වර්ෂයේදී ගණුදෙනුකරුවන්ගේ පහසුව සඳහා ජංගම යෙදුමක් හඳුන්වා දීමට සැලසුම් කර ඇත. කෙසේ වෙතත්, සමාගම මෙතෙක් එම කාර්යය සඳහා ජංගම යෙදුමක් හඳුන්වා දී නොතිබුණි. | අ) වත්මන් තත්ත්වය හේතුවෙන් ක්‍රියාවලියේ යම් ප්‍රමාදයන් ඇති විය. කෙසේ වෙතත්, ගණුදෙනුකාර කළමනාකරණ පද්ධතිය(Customer Management System) ක්‍රියාවට නැංවෙමින් පවතින අතර, එය ලබන වසරේ දී ජංගම යෙදුමක් ලෙස භාවිතා කළ හැකිය. | |
| ආ) අභ්‍යන්තර ක්‍රියාවලීන් ශක්තිමත් කිරීමේ අරමුණින් සමාගම විසින් 2019 වන විට නව භාණ්ඩාගාර කළමනාකරණ පද්ධතියක් (Treasury Management System) අත්පත් කර ගැනීමටත් 2020 වන විට පර්යේෂණ සහ සංවර්ධන ඒකකයක් නිර්මාණය කිරීමටත් සැලසුම් කර ඇත. කෙසේ වෙතත්, 2021 සැප්තැම්බර් වන තෙක් ඉහත අරමුණු සම්පූර්ණ කිරීමට සමාගමට නොහැකි වී තිබුණි. | ආ) සමාගම නව භාණ්ඩාගාර පද්ධතියක් ක්‍රියාත්මක කිරීමේ පරිශීලක පිළිගැනීමේ පරීක්ෂණ (UAT) ක්‍රියාවලියේ යෙදී සිටී. (කෝවිඩ් 19 අගුලු දැමීම හේතුවෙන්, පද්ධතියට තාක්ෂණික විශේෂඥ සහාය දුරස්ථ මාධ්‍ය හරහා ලබා දී ඇත).<br><br>දුරස්ථ සහය සමඟ සජීවීව යාමට පෙර කළ යුතු සංවර්ධනයන් කිහිපයක් තිබේ. එහි ප්‍රතිඵලයක් ලෙස එය ප්‍රමාද විය. කෙසේ වෙතත්, එය දැන් පරිශීලක පිළිගැනීමේ පරීක්ෂණය (UAT) අත්සන් කිරීම අවසන් කර ක්‍රියාත්මක වීමට පටන් ගැනීමේ අදියරේ ඇත.<br><br>පර්යේෂණ හා සංවර්ධන ඒකකයක් නිර්මාණය කිරීමේ කටයුතු සිදු වෙමින් පවතින අතර එම ඒකකය පිහිටුවීම සඳහා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාවේ අනුමැතිය ඉල්ලා ඇත. | |